**22-08-2025 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබට ඉගැන්වීම සඳහා පැමිණ සිටින්නේ කවුද? යන්න සිතනා විට ඔබට හිරිගඩු පිපෙන තරමේ සතුටක් ඇති වේවි. ඔබට උගන්වන්නේ උසස්ම උසස් පියාය. මෙවැනි ඉගෙනුමක් කිසිදාක නවත්වන්න එපා.

**ප්‍රශ්නය:** දරුවන් වන ඔබලා දැන් වර්ධනය කර ගන්නේ කුමන විශ්වාසයද? එවැනි විශ්වාසවන්ත බුද්ධියක් ඇති අයගේ සලකුණු මොනවාද?

**පිළිතුර:** මෙම ඉගෙනුම ඉගෙනීමේදී ඇති විශ්වාසය රජුන්ගෙනුත් ද්විත්ව ඔටුන්නක් ඇති රජෙක් බවට පත්වීමටයි. දෙවියන්ම පැමිණ ඔබට උගන්වනවා. ඔබව ලෝකයේ පාලකයෙක් බවට පත් කරවනවා. දැන් ඔබලා ඔහුගේ දරුවන් බවට පත්විය යුතුයි. එමනිසා, දැන් ඔබ මෙම දැනුම මුළුමණින්ම ලබා ගත යුතුයි. කුඩා දරුවන් තම මව සහ පියා ළඟට හැර වෙන අය ළඟට යෑමට කැමති නැත. එලෙසම ඔබටද දැන් අසීමිත පියා හමු වී ඇති නිසා ඔහු හැර වෙනත් අය වෙත යාමට අකමැත්තක් දැක්විය යුතුයි. ඔබ ඒකායන ඔහුව දිගටම සිහිපත් කළ යුතුයි.

**ගීතය:** අළුයම පැය කිහිපයේදී පැමිණ සිටින්නේ කවුරුන්ද?

ඕම් ශාන්ති. ඔය සුමිහිරි දරුවන් ගීතය ඇසුවා. පැමිණ තිබෙන්නේ කවුරුන්ද? ඔබට උගන්වන්නේ කවුරුන්ද? මෙහි අවබෝධ කරගත යුතු යමක් ඇත. සමහර අය දක්ෂයි. සමහර අය එතරම් දක්ෂ නැහැ. ඉතා හොඳින් ඉගෙන ගත් අය ඉතා දක්ෂයි කිව හැකියි. ග්‍රන්ථ ඉගෙන ගත් අය අන් අයගෙන් බොහෝ ගෞරව ලබනවා. අඩුවෙන් ඉගෙන ගත් අය ලබන්නේ අඩු ගෞරවයකි. ඔබ ගීතයේ වචන ඇසුවා. උගන්වන්න පැමිණ සිටින්නේ කවුරුන්ද? ඔබගේ ගුරුවරයා පැමිණ සිටිනවා. අනෙක් පාසල් වල අය දන්නවා ඔවුන්ගේ ගුරුවරයා එන බව. මෙහි පැමිණ සිටින්නේ කවුද? ඒ ගැන සිතන විට ඔබට හිරිගඩු පිපෙන තරමේ සතුටක් තිබිය යුතුයි. උසස්ම උසස් පියා නැවත වරක් ඔබට ඉගැන්වීමට පැමිණ ඇත. මෙයද අවබෝධ කර ගත යුතු දෙයකි. එයද වාසනාවේ ප්‍රශ්නයකි. කවුද ඔබට උගන්වන්නේ? දෙවියන්ය. ඔහු පැමිණ ඔබට උගන්වනවා. හෘද සාක්ෂිය කියනවා මොනතරම් උසස් ඉගෙනීමක්ද? එහිදී ඉගෙන ගන්නා සමහර අය වහාම ඉන් ඉවත්ව මෙහි පැමිණ දෙවියන්ගෙන් ඉගෙන ගන්නවා. ඔහු සියල්ල එක් තත්පරයකින් අතහැර මෙහි පැමිණ දෙවියන්ගෙන් ඉගෙන ගන්නවා. බාබා පැහැදිලි කරනවා ඔබ දැන් සංගම් යුගයේ බොහෝ උසස් අය බවට පත්ව තිබෙනවා. හැමටම වඩා උසස් වන්නේ ලක්ෂ්මී නාරායන්ය. ඔවුන්ගේ තත්ත්වය ලබා ගැනීමට කුමන ආධිපත්‍යයද ඉගෙන ගන්නේ යන්න ලෝකයේ කිසිම කෙනෙක් දන්නේ නැහැ. එම තත්ත්වය ලබා ගැනීම සඳහා ඔබ දැන් ඉගෙන ගන්නවා. ඔබට උගන්වන්නේ කවුද? දෙවියන්ය. එමනිසා, ඔබ දැන් අනෙක් සියලුම ඉගෙනීම් වලින් ඉවත්ව මෙම ඉගෙනුමෙහි ඔබ විසින්ම ක්‍රියාශීලී වන්න. එසේ වූ විට පමණි කල්පය අවසානයේ නැවත පැමිණෙනුයේ. පියා කියනවා මම සෑම අවුරුදු 5000 කට වරක්ම ඔබට ඉගැනවීම සඳහා මමම පැමිණෙමි. මෙය නම් පුදුමයකි. ඔබ කියනවා උසස් තත්ත්වයක් ලබා ගැනීමට දෙවියන් අපට උගන්වනවා කියා. එසේ තිබියදීත් සමහරු ඉගෙන නොගනී. එයට බාබා කියනවා ඔහුට සිහි නුවණ නෑ කියා. පියාගේ ඉගෙනුමට ඔහු සම්පූර්ණ අවධානය යොමු කරන්නේ නෑ. ඔහු පියා අමතක කරනවා. ඔබ කියනවා බාබා, මට අමතක වුණා. ගුරුවරයා පවා අමතක වුණා. ඒ තමයි මායාගේ කුණාටු. නමුත් මෙම අධ්‍යාපනය ඔබ ඉගෙන ගත යුතුයි. හෘද සාක්ෂිය කියනවා මෙම දැනුම දෙවියන් උගන්වන නිසා ඔබ ඒ සඳහා සම්පූර්ණ ක්‍රියාශීලී විය යුතුයි. මෙය කුඩා දරුවන් පවා ඉගෙන ගත යුතුයි. හැම කෙනෙක්ම ජීවයක්ය. ලොකු හෝ කුඩා වන්නේ ශරීරයයි. ජීවය කියනවා මම ඔබගේ කුඩා දරුවෙක් බවට පත්වෙනවා. හොඳයි ඔබ දැන් මට අයිති වෙලා අවසානයි. ඔබ ඉගෙන ගත යුතුයි. ඔබලා එතරම් කාලයක් කිරි වලින් හැදෙන දරුවන් නොවෙයි. පළමුව එන්නේ දැනුමයි. බොහෝ වූ අවධානයක් මේ සඳහා යෙදිය යුතුයි. ශිෂ්‍යයෝ මෙහි එන්නේ උසස්ම ගුරුවරයා වෙතටයි. එහි ඔබට ඉගැන්වීම සඳහා නියම කරන ලද ගුරුවරුන්ද ඇත. කෙසේ නමුත්, උසස්ම ගුරුවරයාත් මෙහි සිටිනවා. සත් දින උණු කිරීමේ උදුන සිහිපත් වෙනවා. පියා කියනවා මා සිහිපත් කර පවිත්‍රතාවය පවත්වාගන්න. ඔබ දිව්‍යමය ගුණධර්ම උකහා ගන්නේ නම් ඔබ එම තත්ත්වයට පත් වේවි. ඔබ අසීමිත පියාව සිහිපත් කළ යුතුයි. කෙනෙකු වෙන දෙමව්පියෙකුගේ කුඩා දරුවෙකු තමා වෙත ගැනීමට උත්සාහ කළද එම දරුවා ඔවුන් ළඟට

නොයයි. දැන් ඔබත් අයිති වී ඇත්තේ අසීමිත පියාටයි. එමනිසා, ඔබ ද වෙන කිසිවෙකු දෙස බැලීමටවත් අවශ්‍ය නැත. ඔහු කවුරු වුවද ප්‍රශ්නයක් නැත. ඔබ දන්නවා ඔබ දැන් අයිති වෙලා ඉන්නේ උසස්ම උසස් පියාට පමණක් බව. ඔහු ඔබව රජවරුන්ගෙත් ද්විත්ව ඔටුන්නක් ඇති රජෙක් බවට පත් කරවනවා. මන්මනාභව් යනු ආලෝකයේ ඔටුන්නයි. මද්යාජිභව් යනු මුතු මැණික් ඔබ්බවන ලද ඔටුන්නයි. මෙම ඉගෙනුමෙන් ලෝකයේ පාලකයෙක් බවට පත් වෙනවාය යන විශ්වාසය ඔබ වර්ධනය කර ගත යුතුයි. සෑම අවරුදු 5000 කට වරක් ඉතිහාසය මතු වෙනවා. ඔබ රාජ්‍යයක් ලබා ගන්නවා. අනෙක් සෑම ජීවයක්ම සාමයේ දේශය වන ඔවුන්ගේ නිවහනට යනවා. ජීව වශයෙන් ඔබලා නිවහනේ පියා සමඟ මූලිකම වශයෙන් වාසය කළ බව දරුවන් වන ඔබ අවබෝධ කර ගන්නවා. දැන් පියාට අයිති වීමෙන් පසුව ඔබ දිව්‍ය ලෝකයේ පාලකවරු බවට පත් වෙනවා. භාරතයේ සියලුම මිනිසුන් මේ කාලයේ අනාථයෝය. අනාථයෝ යනු දෙමව්පියන් නොමැති අයයි. ඔවුන් නිරන්තරයෙන්ම වටේටම හැපි හැපී වැටෙනවා. දැන් ඔබලාට පියා හමුවී තිබෙනවා. දැන් ඔබ මුළු ලෝක චක්‍රයම දන්නවා. එමනිසා, ඔබ ඇතුලත සතුටේ බුබුළු නැඟිය යුතුයි. අප දැන් අසීමිත පියාගේ දරුවන්ය. උසස්ම ජීවය වන උසස්ම පියා දැන් බ්‍රහමිණ්වරුන්ගේ අළුත් ලෝකය ප්‍රජාපිතා බ්‍රහ්මා මඟින් නිර්මාණය කෙරෙනවා. මෙය ඉතා පහසුවෙන් අවබෝධ කර ගත හැකි දෙයකි. එහිදි ඔබගේ ප්‍රතිරූප නා නා විධ වර්ගයේ පිළිම ලෙස නිර්මාණය වේ. ඉන් විදහා දක්වන්නේ ඔබගේ උපත් 84 ක කතාවයි. අප දේවතාවන්, රණ ශූරයින්, වෙළඳුන් බවට පත් වෙනවා. පියා උගන්වන ලද බ්‍රහ්මිණ්වරු අතුරුදහන්ව ඇති නිසාත් ඔවුන්ගේ නම් අංශුමාත්‍රයක්වත් නැති නිසාත් සාමාන්‍ය මිනිසුන් මෙය දන්නේ නැහැ. මෙම සියලුම කරුණු ඉංග්‍රීසි භාෂාවෙන් ඔබට ඉතා හොඳින් පැහැදිලි කර දිය හැකියි. ඉංග්‍රීසි භාෂාව අවබෝධ කර ගත හැකි අය මේවා පරිවර්ථනය කර අන් අයට ද පැහැදිලි කර දෙන්න. පියා දැනුමෙන් පිරිපුන් ය. මේ ලෝක චක්‍රය කැරකෙන්නේ කෙසේද යන දැනුම තිබෙන්නේ ඔහු ළඟ පමණි. ඉගෙනුම යනු මෙයයි. පියා සිහිපත් කිරීම යෝගා නම් වේ. ඉංග්‍රීසි භාෂාවෙන් එය එක් වූ යන්නයි. පියා සමඟ එකතු බව, ගුරුවරයා සමඟ එකතු බව සහ සත්ගුරු සමඟ එකතු බවයි. මෙම එකතුව දේව පියා සමඟයි. පියා ඔහු විසින්ම කියනවා මා සිහිපත් කරන්න. ශාරීරික කිසිවකු සිහි කරන්න එපා. මිනිසුන් ගුරු කෙනෙක් හදාගෙන ග්‍රන්ථ ඉගෙන ගන්නවා. ඔවුන් ළඟ කිසිම අරමුණක් සහ ඉලක්කයක් නැහැ. ඉන් ඔවුන්ට විමුක්තිය ලබා ගත නොහැකියි. පියා කියනවා මම පැමිණියේ සියලු දෙනාවම නැවත නිවස කරා ගෙන යාමටයි. ඔබ දැන් ඔබගේ බුද්ධියේ යෝගාව පියා සමඟ සම්බන්ධව තබාගත යුතුයි. ඔබට එහි ලඟා විය හැක්කේ ඉන් පමණි. ඔබ හොඳින් ඔහුව සිහිපත් කිරීමෙන් ලෝකයේ පාලකයෙකු බවට පත් වනවා. ලක්ෂ්මි සහ නාරායන් පාරාදීසයේ පාලකයෝ බවට පත්ව සිටියා. මේවා පැහැදිලි කරන්නේ කවුරුන්ද? පියා දැනුමෙන් පිරුණු කෙනා ලෙස හඳුන්වනවා. මිනිසුන් කියනවා ඔහු අන්තර්යාමි කියා (අපගේ සියලු දේ දන්නා එකම කෙනා). ඇත්තෙන්ම, 'අන්තර්යාමි' යන වචනය තරම් දෙයක් තවත් නැත. සෑම කෙනෙක් තුළම සිටින්නේ ජීවයක්ය. ජීවයක් කරන්නේ කුමක්ද යන්න හැම කෙනාම දනී. සියලුම මනුෂ්‍යයන් අන්තර්යාමීය. ඉගෙනුම ලබන්නේ ජීවයන්ය. පියා ඔය දරුවන් ජීව අවධානයට පත් කරවයි. ජීවයන් වන ඔබලා වාසය කරන්නේ අශාරීරික ලෝකයේය. ජීව වන ඔබලා ඉතාම කුඩාය. ඔබගේ චරිත කොටස රඟපෑම සඳහා බොහෝ වාර ගණනාවක් ඔබ මෙහි පැමිණ ඇත. පියා කියනවා මම තිතකි. මට වැඳුම් ලැබීමට නොහැකිය. එසේනම් ඔවුන් එය කරන්නේ ඇයි? එසේ කිරීමට අවශ්‍යතාවයක් නැහැ. මම පැමිණෙන්නේ ජීව වන ඔබලාට ඉගැන්වීමටයි. මම ඔබට රාජ්‍යය ලබා දෙමි. ඉන්පසු ඔබ රාවණ්ගේ රාජ්‍යයට ගිය පසු සම්පූර්ණයෙන්ම මා අමතක කරයි. පළමු කොටම ඔබලාගේ චරිත කොටස රඟපෑමට පහළට එන්නේ ඔය ජීවයන්ය. මිනිසුන්, ඔවුන් උපත් මිලියන 8.4 ක් ගන්නා බව පවසන නමුත්, පියා කියනවා උපත් උපරිමය 84 ක් බව. ඔබ විදේශයකට ගොස් එහිදි මෙම කරුණු මතක් කළානම් ඔවුන් කියාවි ඔවුන්ගේ රටේත් මේ දේ උගන්වන්න කියා. ඔවුන් කියාවි එහිදි ඔබට ලැබුණේ රුපියල් දාහක් පමණ වුවත් අපි ඔබට රුපියල් දහසේ සිට විසිදහස දක්වා දෙන්නම්. අපිටත් මේ දැනුම දෙන්න. දේව පියා අප ජීවයන්ට උගන්වනවා. විනිශ්වයකරුවන් වැනි අය වන්නේ ජීවයයි. සියලුම මනුෂ්‍යයන් සිටින්නේ ශරීර අවධානයෙනි. මෙම දැනුම ඔවුන් කිසිවෙකුටත් නැත. බොහෝ උසස් දර්ශනවාදියෝ සිටියද ඔවුන් කිසිවකු ළඟ මෙම දැනුම නැත. අශාරීරික දෙවියන් වන පියා පැමිණෙන්නේ අපට උගන්වන්නයි. අප ඉගෙන ගන්නේ ඔහුගෙන්ය. මෙම දේවල් ඔවුන් ඇසූ කල ඔවුන් පුදුමයට පත් වේවි. මෙවැනි දේවල් ගැන ඔවුන් කිසිවකු අසා හෝ කියවා නැත. ගලවා ගන්නා හා මඟ පෙන්වන්නා එකම පියා පමණි. ගැලවුම්කරු ඔහු වන නිසා ඔබ යේසුස් වහන්සේ සිහිපත් කරන්නේ ඇයි? මෙම කරුණු වඩාත් පැහැදිලිව ඔවුන්ට පැහැදිලි කරන්න, එවිට ඔවුන් පුදුම වේවි. ඔවුන් මෙසේ කියාවි අඩුම ගානේ මේ දේවල් අපට අහන්නවත් ඉඩ දෙන්න. පාරාදීසය ස්ථාපනය වෙමින් ඇත. මෙම මහා භාරත යුද්ධය ඒ සඳහායි. පියා කියනවා මම ඔබලාව ද්විත්ව ඔටුනු පැළඳි

රජවරුන්ගෙත් රජවරු බවට පත් කරවනවා. එහි පවිත්‍රතාවය, සාමය, සෞභාග්‍යය යන සියලු දේ ඇත. දැන් හිතන්න කොතරම් අවුරුදු ගණනක් ගෙවී ගොස් ඇතිද කියා. යේසුස් වහන්සේගේ පැමිණීමට අවුරුදු 3000 කට පෙර ඔවුන්ගේ රාජධානිය වූයේය. මෙය ආධ්‍යාත්මික දැනුම යැයි ඔබ පවසයි. මෙම කෙනා උත්තරීතර පියාගේ සෘජු දරුවාය. අපි ඔහුගෙන් රාජයෝගා ඉගෙන ගන්නෙමු. මෙම දැනුම ලෝකයේ ඉතිහාසය සහ භූගෝලය නැවත නැවතත් සිදු වන්නේ කෙසේද යන්න ගැනයි. ජීව වන අප හැම කෙනෙක් තුළම අපගේ උපත් 84 සම්පූර්ණ කොටස අප තුළම පටිගත වී ඇත. මෙම යෝගා බලයෙන් ජීව සතෝප්‍රධාන් වී ස්වර්ණම යුගයට යනු ඇත. එමනිසා, ඔවුනට රාජ්‍යයක් අවශ්‍යය. පරණ ලෝකයේ විනාශය සිදුවිය යුතුය. දැන් මෙය ඔබ ඉදිරිපිට දිගහැරේ. පසුව එකම ආගමක පිහිටි ලෝකයක් ඇති වනු ඇත. මෙය පාපකාරී ජීවයන්ගේ ලෝකයයි. ඔබ දැන් පවිත්‍ර වෙමින් සිටී. ඔවුන්ට කියන්න මෙම සිහිපත් කිරිමේ බලයෙන් අප පවිත්‍රතාවයට පත් වන විට අනෙක් හැම දේම විනාශ වේ. ස්වභාවික ව්‍යසන පවා ඇති වේවි. මේ සියල්ලෙහිම සැබෑ තත්ත්වය හඳුනා ගත යුතු වන අතර දිව්‍යමය දර්ශන වලින් පවා එය දැකිය හැකිය. මේ සියල්ලම විනාශයට පත් වීමටයි යන්නේ. පියා පැමිණ සිටින්නේ දේවතා ලෝකය ස්ථාපිත කිරිමටයි. මේ දේවල් අහන විට ඔවුන් කියාවි ඔහෝ, මේ අය දෙවියන් වන පියාගේ දරුවන් විය යුතුයි. දරුවනි, ඔබලා දන්නවා මෙම යුද්ධය සිදුවනවා මෙන්ම ස්වභාවික ව්‍යසනද සිදුවනවා. එවිට තත්ත්වය කෙසේ වේවිද? සියලුම විශාල ගොඩනැගිලි ආදිය වැටෙන්නට පටන් ගන්නවා. අවුරුදු 5000 ට පෙර කළ ඔවුන්ගේම විනාශය සිදුකිරිමට බෝම්බ සාදා ඇති බව ඔබ දන්නවා. බෝම්බ සූදානම් කර අවසන්ය. ලෝකය ජය ගැනීමට ඇති යෝගා බලය කුමක්ද? කිසිවෙකු මෙය දන්නේ නැත. ඔවුන්ට කියන්න විද්‍යාව ඔබලාව විනාශ කරනවා. අප පියා සමඟ යෝගී වී සිටින්නෙමු. නිශ්ශබ්දතාවයේ බලයෙන් අප පවිත්‍රතාවයට පත්ව ලෝකය ජය ගන්නෙමු. පාරිශුද්ධකරු වන්නේ එකම පියා පමණයි. ඔහු පිටත්ව යාමට පෙර ස්ථිර වශයෙන්ම පවිත්‍ර ලෝකය ස්ථාපනය කරනු ඇත. මෙය නාටකයෙහි නැවත නැවතත් සිදුවේ. එම බෝම්බ ඔවුන් නිර්මාණය කර තිබෙන්නේ නිකම් තබා ගැනීමට නම් නොවේ. මේ ආකාරයෙන් ඔබ පැහැදිලි කර දෙන විට දෙවියෝ ඔබ වෙත පැමිණ ඇති බවත් ඔබට අධිකාරීත්වයක් ඇති බවත් ඔවුන්ට හැඟේවි. මෙයද නාටකයේ තීරණය වී ඇති දෙයකි. මෙවැනි දේ ඔවුන්ට කියන විට ඔවුන් සතුටට පත් වේවි. ජීවයන්ගේ චරිත කොටස් මෙම දෛවෝපගත නාටකය තුළ කෙසේ පටිගත වී ඇත්ද. යේසුස් වහන්සේ ආගමක් ස්ථාපිත කිරිමට ඔහුගේ වෙලාවට පහළට පැමිණෙයි. එවැනි අධිකාරීත්වයකින් ඔබ පැහැදිල කර දෙන විට ඔවුන් අවබෝධ කර ගනීවි පියා පැහැදිලි කරන්නේ සියලුම දරුවන්ට බව. එමනිසා, දරුවන් වන ඔබලා මෙම ඉගෙනුමෙහි යෙදී සිටිය යතුය. පියා, ගුරුවරයා හා ගුරු එකම කෙනෙකි. ඔහු ඔබට දැනුම දෙන්නේ කෙසේද කියා ඔබත් අවබෝධ කර ගනී. ඔහු සියලු දෙනාවම පවිත්‍ර කර නැවත නිවහන කරා ගෙන යයි. දේවතා වංශය පැවති කල ඔබ පවිත්‍ර විය. ඔබ දෙවි දේවතාවන්ව සිටියේය. මේ අයුරින් ඔබ ඔවුන්ට කතාකරන විට ඔබ ඉතා දක්ෂ විය යුතුවා මෙන්ම හොඳ වේගයකුත් තිබිය යුතුය. ඔවුන්ට කියන්න අනෙක් ජීව සියල්ලම වාසය කරන්නේ සුමිහිරි නිවහනේ බව. ඔබලාව ආපසු නිවසට ගෙන යා හැක්කේ පියාට පමණි. එම පියා සැමගේම විමුක්තිදායකයාය. භාරතය ඔහුගේ ජන්ම දේශයයි. මෙම වන්දනාව ඉතාමත් උසස්ය. සැම කෙනෙක්ම තමෝප්‍රධාන් වී ඇති බව ඔබ දනී. සැම කෙනෙක්ම නැවත උපත් ගත යුතුය. කිසිම කෙනෙකුට තවම නිවසට යා නොහැකිය. මෙවැනි කරුණු ඔබ ඔවුන්ට පැහැදිලි කරන විට ඔවුන් බොහෝ පුදුමයට පත් වේවි. බාබා කියනවා ඔබ යුවළක් ලෙසින් මෙය කතා කරන විට ඔබ බොහොම හොඳයැයි යන්න ඔවුන්ට අවබෝධ වේවි. මුල දී භාරතයේ පවිත්‍රතාවය තිබුණා. ඉතින් ඔබ කොහොමද අපවිත්‍ර වුණේ? ඔබට මේ ගැනත් ඔවුන්ට කියා දිය හැකියි. වැඳීමට සුදුසුව සිටි අය වඳින්නන් බවට පත්වුණා. ඔවුන් අපවිත්‍ර වන විට ඔවුන්වම වැඳීමට පටන් ගන්නවා. රජවරු දේවතාවරුන්ගේ ප්‍රතිරූප ඔවුන්ගේ ගෙවල් වල තබා ගෙන සිටිනවා. ආලෝක ඔටුන්න නොමැති රජවරු ද්විත්ව ඔටුණු පැළඳ සිටි දේවතාවරුන්ව වඳිනවා. එම රජවරුද වඳින්නෝය. ඔවුන් දේවතාවරුන් වඳින නිසා ඔවුන් දෙවි දේවතාවරුන් යනුවෙන් හැඳින්විය නොහැකිය. ඔවුන් වැඳීමට සුදුසුව සිට පසුව වඳින්නන් බවට පත් වුණා. රාවණ්ගේ රාජ්‍යය පටන් ගැනීමත් සමඟම ඔවුන් අපවිත්‍ර බවට පත් වුණා. එය දැන් රාවණ්ගේ රාජ්‍යයයි. ඔබද ඔවුන් සමඟම ඉඳගෙන මෙම කරුණු ඔවුන්ට පැහැදිලි කර දුන්නේ නම් ඔවුන්ට ඉහළම ප්‍රීතියේ අත්දැකීම ලැබිය හැකියි. රෝද දෙකේ කරත්තයක් හෙවත් ජෝඩුවක් එකට එකතුව පැහැදිලි කරන්නේ නම් ඔවුන්ට බොහෝ පුදුමයන් පෙන්විය හැකිය. ජෝඩු වන අප වැඳීමට සුදුසු තත්ත්වයට පත් වෙමින් සිටිමු. අපි අපේ උරුමය වශයෙන් පවිත්‍රතාවය, සාමය හා සෞභාග්‍යය ලබා ගනිමින් සිටින්නෙමු. ඔබගේ පින්තූර නිර්මාණය වී ඇත. මෙය දෙවියන්ගේ පවුලයි. එහි සියල්ලන්ම පියාගේ දරුවන්ය, ඔහුගේ මුණුපුරු මිනිබිරියන්ය. එපමණයි. එහි වෙනත් කිසිම නෑ සබඳතාවයක් නැත. ඉතා සුළු කොටසක් දේවතාවන් බවට පත් වන එය අළුත් ලෝකයයි. ඉන්පසු පැතිරිම

ක්‍රම ක්‍රමයෙන් සිදුවේ. මෙම දැනුම අවබෝධ කර ගත යුතුව ඇත. මෙම බාබා ව්‍යාපාර වල යෙදී සිටි උසස් වෙළෙන්දෙක්ව සිටියා. ඔහු කිසිම දෙයක් ගැන සැලකිල්ලක් දැක්වූයේ නැත. පියා පැමිණ උගන්වනවා යන්න දුටුකල ලෝක විනාශය ඉදිරියේය යන්න වටහාගෙන ඔහු සතු සියල්ල වහාම අත්හැරියා. ඔහු රාජ්‍යයක් ලබා ගැනීමට යනවාය යන්න ඉතා පැහැදිලිව අවබෝධ කර ගත්තා. ඉතින් මේ කරන 'බොරු වැඩ' වලින් ප්‍රයෝජනය කුමක්ද? දෙවියෝ උගන්වන බව ඔබට අවබෝධ වනවා. එමනිසා, ඔබ ඉතා හොඳින් ඉගෙන ගත යුතුය. ඔහුගේ උපදෙස් අනුගමනය කරන්න. පියා කියනවා ඔබ ජීවයක්ය යන්න කෙරෙහි සැලකිලිමත් වී පියාව සිහි කරන්න. පියාව අමතක කිරිමට ඔබට ලැජ්ජා නැතිද? එම කුල්මත් බව ඔබට නැතිද? සමහර අය ඉතා හොඳින් නැවුම් බවට පත්ව පසුව සෝඩා වතුර වගේ තත්ත්වයට පත්වනවා. දරුවනි, ඔබලා දැන් සෑම ගමකටම සේවය කිරිම සඳහා උත්සාහ ගත යුතුය. බාබා කියනවා පළමුව ඔවුන්ට කියන්න ජීවයන්ගේ පියා කවුද? දෙවියන් අශාරිරිකයි. මෙම අපිරිසිදු ලෝකය පිරිසිදු කරන්නේ ඔහුම පමණයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වූණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. උත්තරීතර ගුරුවරයා සේ පරමාත්ම දෙවියන්ම පැමිණ අපට උගන්වයි. එමනිසා, හොඳින් ඉගෙන ගෙන ඔහුගේ උපදෙස් පිළිපදින්න.
2. නිහඬතාවයේ බලය ඔබ තුළට ලබා ගත හැකි වන තරමට පියා සමඟ යෝගී වන්න. නිහඬතාවයේ බලයෙන් ලෝකය ජය ගන්න. අපිරිසිඳු බවින් පාරිශුද්ධත්වයට පත් වන්න.

**වරදානය:** ඔබ මාස්ටර් පිරිනමන්නෙකු සහ ආශිර්වාද පිරිනමන්නෙකු වී සේවය කිරීමට ඔබේ කාලය සහ සිතිවිලි කැප කරත්වා.

දැන්, ඔබ වෙනුවෙන්, ඔබේ ශරීරය සඳහා, ඔබේ මනස සඳහා, ඔබේ ආධ්‍යාත්මික උත්සාහය සඳහා හෝ නෑ සබඳතා වල වගකීම් ඉටු කිරීම සඳහා යන සුළු කාරණාවල ඔබේ කාලය භාවිතා කරනවා වෙනුවට, මෙම සේවය කිරීමට එය කැප කරන්න. දැන් මෙම භාරවීමේ උත්සවය සමරන්න. සෑම හුස්මකම සේවය කිරීමට සෙනෙහස තබාගෙන සේවය කිරීම තුළ මුසුව කැප වී රැඳී සිටින්න. සේවය කිරීමෙහි ඔබව සම්බන්ධ කර වීමෙන්, ඔබට ස්ව ප්‍රගතිය සඳහා වන තිළිණයක් ඉබේටම ලැබෙනු ඇත. ස්ව යහපත ලෝක යහපත හා මුසුව පවතී. එබැවින්, නිරන්තර, මහාදානීවරයෙකු, මාස්ටර් පිරිනමන්නෙකු සහ ආශිර්වාද පිරිනමන්නෙකු වන්න.

**පාඨය:** ඔබගේ ආශාවන් අඩු කරන්න එවිට ඔබගේ ගැටළු අඩු වේවි.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: සහජ යෝගීවරයෙක් වීම සඳහා, පරමාත්ම දෙවියන්ගේ සෙනෙහසේ අත්දැකීම් ලබන්න.**

ලෞකික ආකාරයකින්, දෙදෙනෙකු එකිනෙකාට ආදරය කරන විට, ඔවුන්ගේ මුහුණෙන්, ඔවුන්ගේ ඇස් වලින් සහ ඔවුන්ගේ වචන වලින්, ඔවුන් පෙම්වතුන් ලෙස සෙනහසින් බැඳී සිටින බව ඔබට දැනගත හැකිය. එලෙසම, ඔබ වේදිකාවකට යන විට, පරමාත්ම පියාගේ සෙනෙහස ඔබෙන් මතු වී ඇති ප්‍රමාණයට අනුව, සෙනෙහසේ ඊතල ජීවාත්මයන්ට වැදී ඔවුන්ට සෙනෙහසේ තුවාල සිදුකරනු ඇත.